දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/14/21/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.05. 20

ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**<u>2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>බෞද්ධ කටයුතු සමායෝජක/ සංවර්ධන නිලධාරී/ සංවර්ධන සහකාර</u>**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අනුයුක්තව බෞද්ධ කටයුතු සමායෝජක / සංවර්ධන නිලධාරී/ සංවර්ධන සහකාර තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව වහාම එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යථෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

04) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

06) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

07) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

08) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ බෞද්ධ කටයුතු සමායෝජක/ සංවර්ධන නිලධාරී/ සංවර්ධන සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2024

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය | රා.සේ.කො. තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ඕ.පී. නිලන්ත ප්‍රදීප් කුමාර මහතා | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිහගොඩ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වැලිගම | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 2 | කේ.පී.එස්.ජී.කේ. විජේසූරිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිහගොඩ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දික්වැල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 3 | ඩී.ජී. විජිතා නිශාන්ති මිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දික්වැල්ල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොටපොල | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 4 | ඒ.එම්.පී.පී. අබේකෝන් මහතා | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බියගම | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | කේ.එස්. මොහොට්ටි මිය | සංවර්ධන නිලධාරී II | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දික්වැල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 6 | එම්.ජී.සී.කේ. මානිංගමුව මිය | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කඩුවෙල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොළොන්නාව | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 7 | ඩී.එම්. වීරසිංහ මහතා | සංවර්ධන නිලධාරී II | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙස සංශෝධනය කිරීම |
| 8 | එන්.පී.එච්. ප්‍රියංකා මිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෑගල්ල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාවනැල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 9 | ඒ.එල්.අයි. වික්‍රමසිංහ මෙය | සංවර්ධන නිලධාරී II | රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය | රා.සේ.කො. තීරණය |
| --- | --- | --- | --- | --- | --- |
| 10 | එච්.එම්.පී. නිර්මාලි මිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කහවත්ත | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පැල්මඩුල්ල | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරු චක්‍රය අවලංගු කිරීම |
| 11 | කේ.ජී.එන්. බණ්ඩාර මහතා | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ආරච්චිකට්ටුව | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 12 | එච්.අයි.ජී. රංජනී මිය | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තංගල්ල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , දික්වැල්ල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 13 | එච්.ඒ. සුමනවීර මහතා | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කහවත්ත | ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 14 | එන්.ටී.පී.ජී. මොහාන් නන්දන මහතා | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 15 | යූ. අනුර විජේසිරි මහතා | සංවර්ධන නිලධාරී III | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුරුවිට | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කර 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු වලදී පිරිමි නිලධාරියෙකු අනුප්‍රාප්තික නිලධාරියෙක් ලෙස ලබා දී ස්ථාන මාරුව සිදු කිරීම. |
| 16 | වී.එච්. වීරවංශ මිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දොළුව | ගඟ ඉහළ කොරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 17 | ඩී. නයනා දීපානි මිය | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොල්ගහවෙල | කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 18 | ඩබ්.ජී.ඒ.කේ. සමරනායක මහතා | සංවර්ධන නිලධාරී II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අකුරැස්ස | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , කොටපොල | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 19 | පූජ්‍ය තෙප්පනාවේ සුනිත ස්වාමීන් වහන්සේ | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය | රා.සේ.කො. තීරණය |
|---|---|---|---|---|---|
| 20 | ආර්.එම්.ඩබ්. නිරෝෂා සේනානායක මෙය | සංවර්ධන නිලධාරී | මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් 2025 වර්ෂයේ ස්ථාන මාරු මඟින් නිලධාරියාගේ අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත දැන්වීම |
| 21 | එච්. සරත් බන්දුල මහතා | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | යටියන්තොට ප්‍රාදේශී ලේකම් කාර්යාලය | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 22 | බී.එම්.ඒ. කුමාරි මිය | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | යටියන්තොට ප්‍රාදේශී ලේකම් කාර්යාලය | නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 23 | ඒ.එම්.එල්. පාලිත අතපත්තු මහතා | බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 24 | බී.ජී. කීර්තිරත්න මහතා | සංවර්ධන නිලධාරී II | පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |